සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 - 2023
## Third Term Test - Grade 08 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

උපදෙස් :
- තෝරාගත් එක් ක්ෂේත්‍රයකට අදාළව දී ඇති ක්‍රියාකාරකමේ නිරත වන්න.
- සෑම ක්ෂේත්‍රයකට ම අදාළව ඇති ක්‍රියාකාරකමක් සඳහා නිර්ණායක පහක් ඇති අතර එක් නිර්ණායකයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 ක් හිමිවේ. අවසානයේ එම ලකුණු 100 ට පරිවර්තනය කර ලකුණු ලබා දෙනු ලැබේ.

ප්‍රායෝගික ක්‍රියාකාරකම අංක 01 - කෘෂිකර්මය

02 - ආහාර

03 - ආරම්භක තාක්ෂණය

04 - ව්‍යාපාර කටයුතු

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 - 2023**
**Third Term Test - Grade 08 - 2023**

# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

**කාලය මිනි. 40 යි**

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 01 - කෘෂිකර්මය

**අවශ්‍ය ද්‍රව්‍යය**


මූඩිය සහිත ප්ලාස්ටික් බෝතලයක් (කට ලොකු) කපු පුළුන් කැබැල්ලක්, පැන් බටයක් හෝ බීම බටයක් පළතුරු යුෂ ස්වල්පයක්, ටුවයින් නූල් කැබැල්ලක්.

**උපකරණ**

පිහියක් (උල් සහිත)

**ගුරු උපදෙස්**

- දී ඇති රූප සටහන කාර්ය පරිශ්‍රයේ තබන්න.




- සිසුන් කණ්ඩායම් කරන්න.
- උපකරණ හා ද්‍රව්‍ය කාර්ය පරිශ්‍රයේ තබන්න.

**සිසු උපදෙස්**

- කාර්ය පරිශ්‍රයේ ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් රූප සටහනේ ආකාරයට පෙරමෝන උගුලක් සකස් කරන්න.

**ලකුණු ලබාදීමේ ක්‍රමවේදය**

- නිවැරදි ක්‍රමවේදය අනුගමනය කිරීම. (ලකුණු 05)
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය හා සහයෝගී බව (ලකුණු 05)
- කාල කළමනාකරණය (ලකුණු 05)
- නිමාව (ලකුණු 05)
- කාර්ය පරිශ්‍රය නැවත සැකසීම (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 08 - 2023
Third Term Test - Grade 08 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 02 - ආහාර

ආහාර නරක්වීම අවම කරමු

**අවශ්‍ය ද්‍රව්‍යය**

- අමු ගස්ලබු ගෙඩි
- ලුණු කුඩු
- අඹරාගත් අබ
- විනාකිරි
- උණුවතුර

**අවශ්‍ය උපකරණ**

- පිහි
- ප්ලාස්ටික් හැඳි
- ලෑලි
- මැටි බඳුන
- කුඩා බෝතලයක් පියන සහිත
- පිරිසිදු රෙදි කැබැල්ලක්

**ගුරු උපදෙස්**

- කල්වේලා ඇතිව ඉහත සඳහන් ද්‍රව්‍ය සහ උපකරණ එක් රැස් කරගන්න.
- අවශ්‍ය පරිදි කාර්ය පරිශ්‍රය සකස් කරන්න.
- ජෑම් බෝතලයක ප්‍රමාණයේ කුඩා බෝතලය සහ ප්ලාස්ටික් හැන්ද සිසුනට සපයා ගැනීමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකමේ නිරතවන ආකාරයේ උපදෙස් ලබාදීම

**සිසු උපදෙස්**

- ගුරු උපදෙස් අනුව අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය සූදානම් කරගැනීම.
- කාර්ය පරිශ්‍රයේ ඇති ද්‍රව්‍ය හා උපකරණ භාවිතා කරමින් ක්‍රියාකාරකමේ නිරතවීම.
- නියමිත කාලයට අනුව ක්‍රියාකාරකම නිම කිරීම.

**ලකුණු දීමේ නිර්ණායක**

- පිළියෙල කරන්නාගේ සෞඛ්‍යාරක්ෂිත බව හා ආහාරයේ සෞඛ්‍යාරක්ෂිත බව (ලකුණු 5)
- අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ නිවැරදිව තෝරා ගැනීම. (ලකුණු 5)
- පිළියෙල කිරීමේ නිවැරදි ක්‍රමය (ලකුණු 5)
- නිමාව (ලකුණු 5)
- වැඩ ස්ථානය නැවත යථාවත් කිරීම (ලකුණු 5)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 08 - 2023
Third Term Test - Grade 08 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 03 – ආරම්භක තාක්ෂණය

පින්සලක් සෑදීම

**අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ**


- ඉවතලන පෑනක්
- පොල් කෙඳි ස්වල්පයක්
- ඉටි පන්දමක්
- ගිනි පෙට්ටියක්
- අඬුවක්

} ඉටි පන්දම පෑන රත්කර ගැනීමට පමණයි. සෑම දරුවකුටම අවශ්‍ය නැත.

**ගුරුවරයාට උපදෙස්**

- නියමිත දිනට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ රැගෙන ඒමට දරුවන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය සහය දරුවන්ට ලබා දෙන්න.
- නිර්ණායක අනුව ලකුණු දෙන්න.

**සිසුන් සඳහා උපදෙස්**



- අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගන්න.
- පෑනේ ඇතුලත ඇති තීන්ත බටය ඉවත් කරන්න.
- සියුම් පොල්කෙඳි එකට තබා කෙළවරින් එක ගානකට කපා ගන්න.
- පෑනේ කෙළවර උල් කොටස කපා ගන්න.
- පොල්කෙඳි කෙළවරින් ඇතුල් කර රත් කරන්න.
- නිවෙන්න පෙර අඬුවෙන් තද කර පොල් කෙඳි එහා මෙහා නොයන සේ සකසා ගන්න.
- පින්සලේ කෙළවර කෙඳි සමානව සිටින සේ කපා ගන්න.

**ලකුණු ලබා දීමේ නිර්ණායක**

1. ක්‍රියාකාරකමට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගැනීම. (ලකුණු 05)
2. පොල්කෙඳි අවශ්‍ය පරිදි සකසා ගන්න (ලකුණු 05)
3. පෑනට පොල්කෙඳි සම්බන්ධ කිරීම (ලකුණු 05)
4. නියමිත කාලය තුළ නිම කිරීම (ලකුණු 05)
5. නිමාව (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 08 - 2023
Third Term Test - Grade 08 - 2023

# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 04 - ව්‍යාපාර කටයුතු

**ක්‍රියාකාරකම**

- අපතේ යන ද්‍රව්‍ය හෝ පරිසරයෙන් සොයා ගන්නා ද්‍රව්‍ය භාවිතා කරමින් ප්‍රයෝජනවත් වන නිර්මාණයක් කරන්න.

**ගුරු උපදෙස්**

1. නිර්මාණ කිරීම සඳහා භාවිතයට ගත හැකි අපතේ යන ද්‍රව්‍ය හා පරිසරයෙන් සොයාගත හැකි ස්වභාවික ද්‍රව්‍ය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
2. නිර්මාණයක ඇති ප්‍රයෝජනවත් බව යන්න සිසුන්ට පැහැදිලි කර දෙන්න.
3. ඇගයීම් නිර්ණායක පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
4. නිර්මාණය කිරීම සඳහා සිසුන්ට ලබා දෙන කාලය පිළිබඳව දැනුවත් කරන්න.
5. නිර්මාණය කිරීමට අවශ්‍ය වන ද්‍රව්‍යවල මූලික සූදානම කරගෙන එන ලෙස සිසුන්ට දැනුම් දෙන්න

**ඇගයීම් නිර්ණායක**

| | | |
|---|---|---|
| 1. | පෙර සූදානම | (ලකුණු 05) |
| 2. | ප්‍රයෝජනවත් බව | (ලකුණු 05) |
| 3. | නිර්මාණශීලී බව | (ලකුණු 05) |
| 4. | නියමිත කාලය තුළ කාර්ය නිම කිරීම | (ලකුණු 05) |
| 5. | කාර්ය පරිශ්‍රය පිරිසිදු කිරීම | (ලකුණු 05) |
| | | (මුළු ලකුණු 25) |